**ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව - 2015**

---------------------------------------------------------

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වන වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය මත සංස්ථාවේ ගනුදෙනු පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 අගෝස්තු 08 දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී. එයට වැඩිමනත් වශයෙන් මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000–1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාවනය සඳහා පදනම**

---------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේ දැයි තීරණය කිරීමට මට නොහැකි විය.

**2. මූල්‍ය ප්‍රකාශන**

------------------

**2.1 මතය ව්‍යාවනය**

-----------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
---------------------------------------

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**
------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01
--------------------------------

2015 දෙසැම්බර් 31 දිනට වූ රු.1,923,741 ක ප්‍රාග්ධන සංචිතය (capital reserve) හා රු.19,523 ක විදේශ විනිමය සැසඳුම් සංචිතයේ (foreign exchange reconciliation reserve) ස්වභාවය හා අරමුණු පිළිබඳ ප්‍රමිතයේ 79(ආ) ප්‍රකාරව හෙළිදරව් කර නොතිබුණි.

(ආ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08**
--------------------------------

(i) 2009 ජනවාරි 01 දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා වූ වර්ෂ 06 ක කාලයක් තිස්සේ සංචිත යටතේ පෙර වර්ෂ ගැලපුම් ලෙස දක්වා තිබුණු රු.38,613,358 ක් සමාලෝචිත වර්ෂයේදී රඳවාගත් ඉපැයීම් ගිණුමට බැර කර තිබුණු නමුත් ප්‍රමිතයේ 49 ඡේදය ප්‍රකාරව එම ශේෂය පිළිබඳව විස්තරාත්මක දත්ත හා තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

(ii) ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දුන් රු.15,715,396 ක් වූ අවසාන නිමි තොග අඩුවෙන් ගැලපීම නිවැරදි කිරීමේදී ප්‍රමිතයේ 49 ඡේදය ප්‍රකාරව අතීතානුයෝගීව ගැලපීම් සිදු නොකර සමාලෝචිත වර්ෂයේ රඳවාගත් ඉපයීම්වල ආරම්භක ශේෂයට ගලපා තිබූ අතර ඒ පිළිබඳව ගිණුම් සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.

**(ඇ)** **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12**
----------------------------------

ආදායම් බදු වියදම හා ගිණුම්කරණ ලාභය අතර සම්බන්ධතාවය පිළිබඳ පැහැදිලි කිරීමක් කර නොතිබුණි.

**(ඈ)** **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**
-----------------------------------

ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.104,988,115 ක් වූ දේපල පිරියත හා උපකරණ තවදුරටත් සංස්ථාවේ කටයුතු සඳහා උපයෝජනය කරමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඉ)** **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20**
---------------------------------

(i) රජයේ ප්‍රදාන වැයකර මිළදීගෙන තිබුණු වත්කම්වලට අදාළව රු.1,237,316 ක් වූ වාර්ෂික ක්ෂය වියදමට සමාන අගයකින් රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය කර නොතිබුණි.

(ii) 2015 වර්ෂයට පෙර වර්ෂවලදී රජයේ ප්‍රදානවලින් අත්පත් කර ගෙන තිබුණු වත්කම් වෙනුවෙන් රු.94,410,400 ක් ක්‍රමක්ෂය කර තිබුණු නමුත් ඊට අදාළ වත්කම් හඳුනාගෙන නොතිබුණි.

**(ඊ)** **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24**

**----------------------------------**

සංස්ථාව විසින් ඉහළ කළමනාකරණය වෙත ගෙවූ කෙටි කාලීන සේවක ප්‍රතිලාභ, වෙනත් දිගුකාලීන ප්‍රතිලාභ සහ සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ පිළිබඳ තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

**(උ)** **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39**

**----------------------------------**

(i) ප්‍රමිතයේ 9 ඡේදය ප්‍රකාරව 2015 දෙසැම්බර් 31 දිනට රු.86,681,085 ක් වූ වෙළඳ ණයගැතියන්ගේ ක්‍රමක්ෂය වටිනාකම (amortized cost) මැනීමකින් තොරව බොල් හා අඩමාණ ණය සඳහා රු.2,493,761 ක් ප්‍රතිපාදනය කර තිබුණි.

(ii) සේවක ණය ක්‍රමක්ෂය වටිනාකම (amortized cost) මැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ වෙළඳපොල පොලී අනුපාතය, සඵල පොලී අනුපාතය ලෙස යොදාගත යුතු වුවත්, 2013 හා 2014 වර්ෂවලදී සඵල පොලී අනුපාතය ලෙස යොදාගත් සියයට 12 ක් වූ අනුපාතයම සාධාරණ හේතු හෙළිදරව් කිරීමකින් තොරව 2015 දෙසැම්බර් 31 දිනට රු.16,710,369 ක් වූ සේවක ණය ක්‍රමක්ෂය වටිනාකම ගණනය සඳහා යොදා ගෙන තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

**-----------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණු රු.141,243 ක් වූ පුනරාවර්තන වියදම්, ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.

(ආ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ජංගම නොවන වත්කම්වල වාර්ෂික ක්ෂය ප්‍රතිපාදනය රු.54,655 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී ණයගැතියන්ගෙන් ලද රු.163,083 ක් විකුණුම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

**-------------------------------**

ගිණුම් විෂයයන් 2 ක ලෙජර් ගිණුම් අනුව ශේෂය හා උපලේඛන/ශේෂ සනාථ කිරීම් අනුව ශේෂය අතර එකතුව රු.2,340,683 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර විස්තර පහත දැක්වේ.

| | ගිණුම් විෂයය | ලෙජර් ගිණුම අනුව ශේෂය | උපලේඛන හෝ ශේෂ සනාථ කිරීම් අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| (අ) | විකුණුම් | 519,887,808 | 522,196,560 | 2,308,752 |
| (ආ) | ලංකා බැංකු ස්ථාවර තැන්පතු | 1,747,780 | 1,715,849 | 31,931 |
| | | | | **2,340,683** |

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | බාහිර පාර්ශවයන්ට පරිත්‍යාග කරන ලද ඖෂධ | 765,352 | විධිමත් අනුමැතීන් |
| (ආ) | පාරිතෝෂික ප්‍රතිපාදනය | 3,958,216 | ගණනය කිරීමට අදාළ උපලේඛන |
| (ඇ) | රඳවාගත් ඉපැයුම් ගිණුමට සිදුකර තිබුණු ගැලපීම් | 93,373,135 | ජර්නල් සටහන් |

### 2.3 ලැබිය යුතු ගිණුම්

2012 ජනවාරි 01 දින සිට ලැබිය යුතුව තිබුණු රු.243,031 ක ආදායම හඳුනාගැනීම සඳහා කිසිදු ලිඛිත සාක්ෂියක් ඉදිරිපත් නොකෙරුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් එම ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ප්‍රමාණවත් ප්‍රතිපාදනයක් සිදුකරද නොතිබුණි.

### 2.4 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, එකතුව රු.353,359,512 ක් වූ දේපළ පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.41,058,076 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.7,968,428 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.33,089,648 කින් වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව වෙනත් ආදායම් රු.2,627,298 කින් අඩුවීම හා පරිපාලන, විකුණුම් හා බෙදාහැරීමේ වියදම් රු.44,027,383 කින් වැඩිවී තිබුණ ද විකුණුම් රු.74,946,110 කින් වැඩිවීම හා විකුණුම් පිරිවැය රු.20,198,388 කින් අඩුවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 3 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.62,731,392 ක් වූ අතිරික්තය 2013 හා 2014 වර්ෂවලදී පිළිවෙලින් රු.42,255,668 ක් හා රු.14,474,024 ක් දක්වා අඩුවී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී රු.62,153,332 ක් දක්වා නැවත වැඩිවී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සහ රජයට ගෙවූ බදු නැවත ගැලපීමෙන් පසු 2012 වර්ෂයේදී රු.194,292,276 ක් වූ දායකත්වය උච්චාවචනයන් සහිතව 2015 වර්ෂය වන විට රු.245,255,493 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 3.2 විග්‍රහත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සහ ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙලින් සියයට 13.75 කින් හා සියයට 6.1 කින් වැඩිවී තිබුණු අතර ජංගම අනුපාතය සියයට 27.63 කින් අඩුවී තිබුණි.

## 3.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය

---------------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.2 මාර්ගෝපදේශය ප්‍රකාරව, මෙහෙයුම් පිරිවැය හෝ ජීවන චක්‍ර පිරිවැය (Operational cost or life cycle cost) ගණනය කර ලංසු ඇගයීම සිදු නොකර යන්ත්‍රයේ පිරිවැය පමණක් ඇගයීමට ලක්කරමින් සමාලෝචිත වර්ෂයේදී රු.4,929,309 ක් වැය කර තේ ඇසුරුම් යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. තවද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, කොන්ත්‍රාත්කරු සමග ගිවිසුමකට එළඹ නොතිබුණු අතර මිලදී ගෙන තිබුණු යන්ත්‍රයේ තිබිය යුතු තාක්ෂණික පිරිවිතර 3 ක් සංතෘප්ත කර නොතිබුණි.